# 19 දරුවන් ප්‍රාථමික පාසලට සහ කණිෂ්ඨ පාසැලට ඇතුළත් කරන විට කළයුතු දෑ



ජපානයේ, දරුවාට අවුරුදු 6 ලබන අප්‍රේල් මාසයේ සිට අවුරුදු 15 ලබන මාර්තු මාසය දක්වා අතර කාලය තුළ දරුවන් පාසැලේ ඉගෙනුම ලබනවා.

ප්‍රාථමික පාසැලේ අවුරුදු 6 ක කාලයක් ඉගෙනුම ලබනවා.
කණිෂ්ඨද්විතික පාසැලේ අවුරුදු 3 ක කාලයක් ඉගෙනුම ලබනවා.
<u>පාඩම් මාලා ( *Jugyō* )</u> සඳහා මුදල් වැයවීමක් සිදුනොවේ.
ප්‍රාථමික පාසැල හා කණිෂ්ඨ ද්විතික පාසැල පිළිබඳ විස්තර දැනගැනීම සඳහා නගර සභාවේ < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙත පැමිණෙන්න.



<ජපානයේ අධ්‍යාපනය>

| වයස | අවුරුදු6 දක්වා | 7 8 9 10 11 12 | 13 14 15 | 16 17 18 | 19 20 21 22 |
|---|---|---|---|---|---|
| පාසැල | ළමා දිවාසුරකුම් මද්‍යස්ථානය ( *Kodomoen* ) ළදරු පාසැල ( *Yōchien* ) දිවා සුරකුම් මද්‍යස්ථානය ( *Hoikuen* ) | ප්‍රාථමික පාසැල ( *Shōgakkō* ) ( වසර 6 ක් ) | කණිෂ්ඨ උසස් පාසැල ( *Chūgakkō* ) ( වසර 3 ක් ) | උසස් පාසැල ( *Kōtō Gakkō* ) | විශ්වවිද්‍යාලය ( *Daigaku* ) |

## (1) අතරමගදී පාසැලට ඇතුළත් වීම

ජපානයට පැමිණීමට පෙර ප්‍රාථමික පාසැලේ හා කණිෂ්ඨ උසස් පාසලේ අධ්‍යාපනය ලබාසිටින දරුවන් සිටීනම් < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙතොස් උපදෙස් ලබාගන්න.
「 <u>පාසැල් මාරු දැනුම්දීමේ පත්‍රය</u> (අතරමගදී පාසලට ඇතුළත් වීමේ අවසර පත්‍රය) ( <u>*Hennyūgaku Tsūchisho*</u> ) 」 නමින් හඳුන්වනුඅතර,මෙම ලියවිල්ල ලබාගෙන මෙහි සඳහන් පාසලට ඇතුළත් විය හැක.

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

① ජපානයේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )
② විදේශ ගමන් බල පත්‍රය ( පාස්පෝර්ට් එක / *Passport* )



## （2） ඔබ පදිංචි ස්ථානයට ආසන්නම පාසැලට දරුවා ඇතුළත් කිරීම තීරණය කර ඇත

ඔබ පදිං චි සිටින ප්‍රදේශයේ පාසැල දරුවන් ඉගෙනිමේ කටයුතු සඳහා යායුතු පාසැල වශයෙන් තීරණය කර ඇත.සන්මු නගරය ඇතුළත ඇති වෙනත් පාසැල් වලට දරුවාව ඇතුළත් කළ නොහැක.විශේෂ හේතුවක් තිබේනම් පමණක් නගරසභාවේ < ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) > වෙත ගොස් උපදෙස් ලබා ගතහැක.



## （3） පාසැල් ජීවිතය

පාසැලේ ගතකරන කාලය පහත සදහන් ආකාරයට වේ.

ප්‍රාථමික පාසැල එක් කාලපරිච්චේදයක ඉගෙනගන්නා කාලය විනාඩි 45වේ.
කණිෂ්ඨ උසස් පාසැලේ එක් කාලපරිච්චේදයක උගන්වන වේලාව විනාඩි 50වේ.
සෙනසුරාදා සහ ඉරිදා දින නිවාඩු දින වේ.
ප්‍රාථමික පාසැලේ එක් ගුරුවරයෙක් සියලුම විෂයන් උගන්වනු ලැබේ.
කණිෂ්ඨ උසස් පාසලේ <u>විෂයන් ( *Kyōka* )</u> අනුව උගන්වන ගුරුවරුන්ද වෙනස් වේ.
ප්‍රාථමික පාසලේ සහ කණිෂ්ඨ උසස් පාසලේ <u>පාසැල් දිවාආහාරය ( *Kyūshoku* )</u> ලබා දෙනු ලැබේ. දිවා ආහාරය සඳහා දෙමාපියන් විසින් මුදල් ගෙවනු ලැබේ.




◎73 පිටුව සහ 74 පිටුවේඅමාරු වචන ◎

※පාඩම් මාලා ( *Jugyō* ) : පාසැලේ දී පාඩම ඉගැන්වීම. දිනපතා ජපන්භාෂාව සහ ගණිතය වැනි විවිධ විෂයන් ඉගෙනුමලබනවා.

※පාසැල් මාරු දැනුම්දීමේ පත්‍රය (අතරමගදී පාසලට ඇතුළත් වීමේ අවසර පත්‍රය) ( *Hennyūgaku Tsūchisho* ) : කුමන පාසැලට ඇතුලත් කරනවාද යනුවෙන් සටහන් කර ඇති ලියවිල්ල.මෙය පාසලට යන පළමු දිනයේදී පාසලට රැගෙන යායුතුයි.

※විෂයන් ( *Kyōka* ) : පාසලේදී උගන්වනු ලබන විෂය මාලාවන්. ජපන් භාෂාව,ගණිතය, විද්‍යාව, සමාජ අද්‍යයනය ආදී විෂයන්

※පාසැල් දිවාආහාරය ( *Kyūshoku* ) : දිවා ආහාරය

| ඉල්ලුම් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| ළමා අධ්‍යාපන අංශය ( *Kodomo Kyōikuka* ) | 279-1බන්චි,තොනොදයි,සන්මුනගරය ( 279-1,Tonodai,Sammu-shi ) | 0475-80-1455 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.15 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.